# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PED/I/CEB/2/16

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2021.05.03

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්.

**<u>රටේ හදිසි විදේශ සෘජු ආයෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා ආයෝජන යෝජනා ලැබීම, ඇගයීම සහ අනුමත කිරීම සම්බන්ධයෙන් වඩා ශක්තිමත් යාන්ත්‍රණයක් අනුගමනය කිරීම සහ එවැනි යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ සහ රජයේ ආයතනවලට පහසුකම් සැපයීම</u>**

1. අමාත්‍ය මණ්ඩලය විසින් රටේ ආයෝජන වේගවත් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් 2021 පෙබරවාරි මස 22 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මහා භාණ්ඩාගාර ලේකම්තුමා විසින් සභාපතිත්වය දරනු ලබන සහ ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් විසින් සාමාජිකත්වය දරනු ලබන ආයෝජන පිළිබඳව වන කළමනාකරණ කමිටුවක් සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පළපුරුදු ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන්ගෙන් සමන්විත ස්ථාවර උපදේශක මණ්ඩලයක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී. මෙම කටයුතු සඳහා පහසුකම් සැලසීමේදී අවශ්‍ය ඕනෑම නිලධාරියෙකු හෝ විශේෂඥයෙකු තෝරා පත්කර ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ආයෝජන පිළිබඳව වන කළමනාකරණ කමිටුවට බලය ලබා දී ඇත.

2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති විධිවිධාන කුමක් වුවද අවසන් විසඳුමක් දක්වා ආයෝජන සම්බන්ධයෙන් වන සියලු කරුණු සහතික කරමින් කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ආයෝජන පිළිබඳව වන කළමනාකරණ කමිටුවට සහ ස්ථාවර උපදේශක මණ්ඩලයට බලය පවරා ඇත. මේ සඳහා ආයෝජකයන්ගෙන් ලැබෙන ආයෝජන යෝජනා ඇගයීම, ලැබී ඇති ආයෝජන යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම, ආයෝජකයින් සමඟ සබඳතා පැවැත්වීම, ආයෝජකයින්, ආශ්‍රිත පාර්ශ්වකරුවන් හා නියෝජිතායතන සමඟ අවශ්‍ය සාකච්ඡා පැවැත්වීම, ගනුදෙනු සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය තීරණය කිරීම සහ විශ්වසනීය ආයෝජන සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සම්බන්ධිත වෙනත් සහායක ක්‍රියාකාරම් යන කරුණු ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් විධිමත් අනාවරණය නොකිරීමේ ගිවිසුමකට

ඇතුළත් වී ඇති ආයෝජකයින් විසින් ඉල්ලුම් කරන ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට බලය පවරා ඇත.

3. දැනටමත් පසුගාමී වී ඇති ආයෝජන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ස්ථාවර උපදේශක මණ්ඩලය විසින් භාණ්ඩාගාර ලේකම්වරයාට උපදෙස් සපයනු ඇත. ඒ සඳහා අවශ්‍ය පරිදි ඕනෑම රේඛීය ආයතනයක් සමඟ කටයුතු කිරීමේ බලය ස්ථාවර උපදේශක මණ්ඩලය වෙත පවතී. ආයෝජන පිළිබඳව වන කළමනාකරණ කමිටුව විසින් නියම කරන පරිදි ස්ථාවර උපදේශක මණ්ඩලයට ඕනෑම ආයතනයක් සමඟ සම්බන්ධවීමට බලය ඇති අතර ආයෝජන යෝජනා සම්බන්ධයෙන් කඩිනම් අනුකූලතාවයක් ලබා දීම සහතික කරමින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සහ එම යෝජනාවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමද ඊට ඇතුළත් වේ.

4. එසේම, ඉහත සඳහන් කර ඇති පරිදි මේවන විට ලැබී ඇති හා අවසන් කර නොමැති ආයෝජන යෝජනා මෙන්ම මූල්‍ය හා භෞතික කාර්යසාධනය අනුව පසුගාමීවන ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් සියලු තොරතුරු සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ආයෝජන පිළිබඳව වන කළමනාකරණ කමිටුව වෙත ඇමුණුම 01 පරිදි ලබා දිය යුතු වේ. රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම රජය සතු සමාගම් ඇතුළු රජය සතු ව්‍යවසායයන්හි සභාපතිවරුන් විසින් එවැනි යෝජනා සිය රේඛීය අමාත්‍යාංශ හරහා මෙම කමිටුව වෙත යොමු කළ යුතු වේ.

5. අවශ්‍ය තොරතුරු සැපයීමට හා පසුවිපරම් විස්තර සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ආයෝජන පිළිබඳව වන කළමනාකරණ කමිටුව සහ ස්ථාවර උපදේශක මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලෙස සියලුම ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම රජය සතු සමාගම් ඇතුළු රජය සතු ව්‍යවසායයන්හි සභාපතිවරුන් තම නිලධාරීන්ට උපදෙස් ලබා දිය යුතුය.

6. එසේම, ඉහත 4 ඡේදයේ සඳහන් පරිදි සියලු යෝජනා සහ යම් පැහැදිලි කරගැනීමක් වෙතොත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ හැක.

6.1. ඊ තැපැල :- camci@ped.treasury.gov.lk.
6.2. දුරකථන :- 0112484510

අත්/කළේ: එස්. ආර් ආටිගල
මහා භාණ්ඩාගාර ලේකම්

පිටපත:- විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

ඇමුණුම 1

| | |
|---|---|
| 1. අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ හෝ රජය සතු ව්‍යවසායේ නම : | |
| 2. ආයෝජන යෝජනාවේ/ ව්‍යාපෘතියේ නම: | |
| 3. ආයෝජන යෝජනාවේ/ ව්‍යාපෘතියේ සාරාංශ විස්තරය : | |
| 4. ආයෝජන වටිනාකම: | |
| 5. අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ රාජ්‍ය ව්‍යවසායේ නම් කරන ලද පුද්ගලයාගේ නම | |
| 6. නම් කර ඇති පුද්ගලයාගේ ඇමතුම් විස්තර ( කාර්යාලීය ලිපිනය , ඊ තැපැල, ජංගම දුරකථන සහ ස්ථාවර දුරකථන අංක) | |